**සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල - 2017**

**---------------------------------------------------------------**

සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.2,369,568 ක් වූ පරිගණක උපාංග තුල 2002 හා 2005 වර්ෂවලදී මිලදීගත් රු.1,533,980 ක් වටිනා භාවිතයෙන් බැහැරව තිබූ පරිගණක අපහරණය කිරීමටත්, 2012 වර්ෂයේදී මිලදීගත් භාවිතයේ පැවති රු. 835,588 ක් වටිනා පරිගණක සම්බන්ධයෙන් ධාරණ අගය නිශ්චයකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලට අදාල නොගෙවූ ත්‍යාග මුදල් රු. 7,150,000 ක් සමාලෝචිත වර්ෂයේදී ආපසු ලැබී තිබූ අතර, එම මුදල අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ලොතරැයි දායක මුදල් ලැබීමක් ලෙස සටහන් නොකර සමාලෝචිත වර්ෂය ආරම්භයේ වූ මුදල් හා මුදල් හා සමාන දෑ ලෙස සටහන් කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 876(3) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වාගෙනයාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කලයුතු බව දැක්වෙතත්, අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු නොකර කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද රෙගුලාසිමාලාව අනුව මේ දක්වා එහි කටයුතු පවත්වාගෙන යමින් තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 142,111,051 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 447,187,633 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 305,076,582 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ත්‍යාග ලාභී පවුල් 2400 සිට පවුල් 3972 ක් දක්වා වැඩිකිරීම නිසා ත්‍යාග වියදම රු. 312,300,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 හා 2017 වර්ෂවලදී දිනුම් අදින ලද ලොතරැයි දිනුම්ලාභීන්ගෙන් පිළිවෙලින් ප්‍රතිලාභීන් 183 ක් සහ 126 දෙනෙකුට හිමි මුදල පිළිවලින් රු. 36,600,000 ක් සහ රු. 25,200,000 ක් ප්‍රතිලාභියා මියයාම, ත්‍යාගලාභියා සහනාධාරලාභියකු නොවීම, විදේශගතවීම, තොරතුරු සොයාගත නොහැකිවීම, එක්වරක් දිනුම් ලබාගත් ප්‍රතිලාභීන් නැවත දිනුම් ඇදීම සඳහා නිශ්චිත කාලපරිච්ඡේදයකට නවතා තැබීමේ ක්‍රමවේදයක් වශයෙන් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා දත්ත පද්ධතිය තුලින් ප්‍රතිලාභීන්ගේ නම් ඉවත් කිරිමට කටයුතු නොකිරීම යනාදී විවිධ හේතු මත දිස්ත්‍රික් කාර්යාලවලින් ත්‍යාග මුදල් ආපසු එවා තිබුණි. මේ අනුව සමෘද්ධිලාභින් සැලකියයුතු සංඛ්‍යාවකට දිනුම් අවස්ථාව අහිමිවීම තුළින් අරමුදලේ දැක්ම හා පරමාර්ථ කෙරෙහි ළඟාවීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය සමෘද්ධිලාභින් සංඛ්‍යාව 16,773,010 ක් වුවද එම සමෘද්ධිලාභීන් අතුරින් වර්ෂය තුළ හිමිකම් ලැබූ ත්‍යාගලාභින් සංඛ්‍යාව 3846 ක් හෙවත් සියයට 0.022 ක් විය. මෙම ත්‍යාගලාභීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ දායකමුදලින් සියයට 91 ක ප්‍රතිශතයක් ගෙවා තිබූ අතර එහි වටිනාකම රු. 769,300,000 ක් විය. මේ හේතුවෙන් සෑම ප්‍රතිලාභියෙකු සඳහාම නිවසක් යන්න අරමුදලේ දැක්ම හා පරමාර්ථ කෙරෙහි ළඟාවීමට අවශ්‍ය කටයුතු සකස් කර නොතිබුණි.

(ඇ) සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ රෙගුලාසි අංක 17 ප්‍රකාරව සෑම දිනුම් ඇදීමක් සිදු කිරීමට පෙර ඒ ඒ මාසයේ සමෘද්ධි සහනාධාරයෙන් ඉවත්වූ සහ නව සහනාධාරලාභීන්ගේ තොරතුරු පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2017 වසර දක්වා වර්ෂ 06 කදී ත්‍යාගලාභී වූ ප්‍රතිලාභීන් 574 කට හිමි රු. 101,550,000 ක ත්‍යාග මුදලක් ප්‍රදානය කිරිමට නොහැකිවී තිබුණි.

(ඈ) දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ රෙගුලාසි අංක 8 ප්‍රකාරව ජයග්‍රාහී ප්‍රතිලාභීන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා සුදුසු ව්‍යාපෘතිවලට යොමු කිරීම අරමුදලේ පරමාර්ථයක් වුවද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 4.2 අරමුණුවලට පටහැනිව අරමුදල් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විශේෂ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරන සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ ගම්මානය තුළ ජීවත්වන ඉතා අඩු ආදායම්ලාභී දිළිඳු පවුල් සඳහා ක්‍රියාත්මක කරන ලද ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතිය යටතේ තෝරාගත් පවුලක් වෙනුවෙන් නිවසක් ඉදිකර දීම සඳහා වන සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉල්ලීමට, 2016/DL/10/01 දරණ භාරකාර මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් 25 ක් තුළ ආදර්ශ ගම්මාන 40 ක් ක්‍රියාත්මක වන අතර, එක් ගම්මානයකට එක් නිවසක් බැගින් නිවාස 40 ක් ඉදිකිරීමට අනුමැතිය ලබාදී තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා සමෘද්ධිලාභීන්ගේ මාසික දායකත්වයෙන් ගොඩනැගී ඇති මෙම අරමුදලින් සමෘද්ධිලාභීන් නොවන පවුල් 6 ක නිවාස ඉදිකිරීම වෙනුවෙන් එක් අයෙකුට රු. 200,000 බැගින් එකතුව රු. 1,200,000 ක් ගෙවා තිබුණි.

(ආ) විශේෂ අවධානය යොමු කළයුතු අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම වෙනුවෙන් අරමුදලේ රෙගුලාසි මාලාවෙන් බැහැරව, සමාලෝචිත වර්ෂයේදී දිනුම් ඇදීමකින් තොරව පුද්ගලයින් 19 ක් සඳහා රු. 2,850,000 ක් වැයකර තිබුණි.

(ඇ) පුත්තලම දිස්ත්‍රික්කයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නගුල් එළිය ගම්මානය අඩු ආදායම්ලාභී ධීවර පවුල් 26 ක් සඳහා ''සමෘද්ධි වාසනා නිවාස'' ගම්මානය ඉදිකිරීම සඳහා අරමුදලේ රෙගුලාසි මාලාවෙන් බැහැරව එක් නිවසකට රු. 500,000 ක උපරිමයකට යටත්ව රු.13,000,000 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුලත් මුදල් රෙගුලාසි 877(2)(ඈ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2021 නොවැම්බර් 08 දින ද ඉදිරිපත් කර තිබුණි.

### 5.2 විගණන කමිටු

---

දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටුවේදීවත් අරමුදලට අදාළ විගණන නිරීක්ෂණ සාකච්ඡාවට භාජනය කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

---

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුලත් මුදල් රෙගුලාසි 877(1) රෙගුලාසිය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර අරමුදල ව්‍යවස්ථාපිත කර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම තුළින් කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුයි.